සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## වර්ෂ අවසාන ඇගයීම - 2011

### 7 - ශ්‍රේණිය

### ගණිතය


නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02යි.

**I කොටස**

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) සුළු කරන්න. $\frac{3}{7}+\frac{2}{7}$

(02) රූපයේ දී ඇති කෝණයේ බාහු නම් කරන්න.




(03) හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න. $5^2$ = ................

(04) 3458හි ඉලක්කම් දර්ශකය කීය ද?

(05) A = { 1ත් 10ත් අතර ඔත්තේ සංඛ්‍යා}
මෙම කුළකයේ අවයව ලැයිස්තුගත කරන්න.

(06) 48 ප්‍රථමක සංඛ්‍යාවල ගුණිතයක් ලෙස ලියන්න.

(07) 24 සහ 32 මහාම පොදු සාධකය සොයන්න.

(08) 2010 හා 2015 වර්ෂ අතර ඇති අධික අවුරුද්ද කුමක් ද?

(09) ග්‍රෑම් 7.5 මිලි ග්‍රෑම්වලින් දක්වන්න.


(10) (-7) + 9 හි අගය සොයන්න.

(11) $\frac{3}{5}$ ට තුල්‍ය භාගයක් ලියන්න.

(12) සමාන්තර රේඛා ඇඳීමට භාවිතා කරන උපකරණ දෙක ලියන්න.

(13) රු.500ක් රුචිරා සහ මලීෂා අතර 2 : 3 අනුපාතයට බෙදූ විට රුචිරාට ලැබෙන මුදල කීය ද?

(14) $x - 2 = 8$ සමීකරණය විසඳීම සඳහා සකස් කළ ගැලීම් සටහන පහත දැක්වේ.
මෙහි ප්‍රතිලෝම ගැලීම් සටහන ලියා $x$ හි අගය ලබා ගන්න.




(15) $x < 5$ අසමානතාවයට අනුව $x$ට ගතහැකි විශාලතම පූර්ණ සංඛ්‍යාව කීය ද?

(16) පෘෂ්ඨ 4ක් සහ ශීර්ෂ 4ක් ඇති ඝන වස්තුවක දාර ගණන කීය ද?

(17) සරල රේඛීය තල රූපවලින් සකස් කළ ටෙසලාකරණයක ශීර්ෂ ලක්ෂ්‍යයක් වටා කෝණවල එකතුය කොපමණ ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

(18) "හිරු බටහිරින් නැගීම" යන සිදුවීමේ විය හැකියාවට 0 - 1 පරිමාණය යටතේ ලබා දිය හැකි ලකුණ කුමක් ද?

(19) පෙට්ටියක අඹ ගෙඩි 40ක් තිබුණි. ඉන් 8ක් නරක් වී තිබුණි. නරක් වූ අඹ ගෙඩි ගණන ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

(20) මහේෂා බීම බෝතලයකින් $\frac{3}{5}$ ක් පානය කළා ය. ඉෂිනි එම වර්ගයේ බීම බෝතලයකින් 0.5ක් පානය කළා ය. වැඩි ම බීම ප්‍රමාණයක් පානය කළේ කවු ද?

## II කොටස

* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) (a) පරිමාණ රූප හා නිර්මාණ යටතේ ඔබ කළ ගවේෂණාත්මක අධ්‍යයනය ගැන සිහිපත් කරන්න

(i) දළ සටහනක් ඇඳීම සඳහා ගුරුතුමා / ගුරුතුමිය ඔබ කණ්ඩායමට ලබා දුන් ස්ථානය කුමක් ද?

(ii) ඔබට ලබා දුන් ස්ථානයේ ඔබ ලබා ගත් මිනුම් මොනවා ද?

(iii) එදිනෙදා ජීවිතයේ දී පරිමාණ රූප භාවිතා කරන අවස්ථා 2ක් ලියන්න.

(iv) 2cm කින් 7m දැක්වේ. මෙම පරිමාණය අනුපාතයක් ලෙස ලියන්න.

(b) පාසලේ බාල දක්ෂ කඳවුරක් සකස් කිරීම සඳහා 100m දිග හා 50m පළල සෘජුකෝණාස්‍රාකාර බිම් කොටසක් සකස් කරන ලදී.

(i) මෙහි දළ සටහනක් ඇඳ දී ඇති තොරතුරු එහි ලකුණු කරන්න.

(ii) සුදුසු පරිමාණයක් තෝරාගෙන එය අනුපාතයක් ලෙස දක්වන්න.

(iii) ඔබ භාවිතා කළ පරිමාණය අනුව බිම් කොටසේ පරිමාණ රූපයක් අඳින්න

(iv) බිම් කොටස වටේ ලණුවක් ඇදීමට අවශය වේ. පරිමාණ රූපයේ කොපමණ දිගකින් එය දැක්විය යුතු ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

02) (a) තමා වඩාත් ම කැමැති පලතුරු වර්ගය පිළිබඳව 7 ශ්‍රේණියේ සිසුන්ගෙන් විමසා ලබා ගත් තොරතුරු පහත වගුවේ දැක්වේ.

| පලතුරු වර්ගය | සිසුන් ගණන |
|---|---|
| ඇපල් | 8 |
| අඹ | 6 |
| දිවුල් | 4 |
| දොඩම් | 2 |
| අන්නාසි | 7 |
| පේර | 3 |

(i) මෙම තොරතුරු තීර ප්‍රස්තාරයක දක්වන්න.

(ii) සිසුන් වඩාත් ම කැමැති පළතුරු වර්ගය කුමක් ද?

(iii) දිවුල්වලට වඩා අන්නාසිවලට කැමැති සිසුන් ගණන කොපමණ ද?

(iv) පන්තියේ සිටින මුළු සිසුන් ගණන සොයන්න.

(b) පන්තියක සිටින සිසුන් කණ්ඩායමක් ගණිත පරීක්ෂණයක දී (මුළු ලකුණු 50න්) ලබාගත් ලකුණු පහත වෘන්ත පත්‍ර සටහනින් දැක්වේ.


| වෘන්ත | පත්‍ර |
|---|---|
| 0 | 2 , 5 , 9 |
| 1 | 5 , 8 |
| 2 | 3 , 5 , 5 , 7 , 9 |
| 3 | 0 , 3 , 4 , 8 |
| 4 | 2 , 4 , 6 , 6 , 7 , 8 |

(i) කණ්ඩායමේ සිටින ළමයින් ගණන කීය ද?

(ii) ලබාගත් වැඩි ම ලකුණ කීය ද?

(iii) ලකුණුවල පරාසය සොයන්න.

(03) (a) රූපයේ දැක්වෙන්නේ සමචතුරස්‍ර දෙකකි. විශාල සමචතුරස්‍රයේ පැත්තක දිග 9cmක් වන් අතර කුඩා සමචතුරස්‍රයේ පැත්තක දිග 6cm කි.




(i) විශාල සමචතුරස්‍රයේ වර්ගඵලය සොයන්න.

(ii) අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය සොයන්න.

(b) (i) වීදුරුවකට සිසිල් බීම 200ml වත්කළ හැකි ය. එවැනි වීදුරු 12ක ඇති සිසිල් බීම ප්‍රමාණය කොපමණ ද?

(ii) සිසිල් බීම බෝතලයක බීම 1.5*l* අඩංගු ය. ඉහත වීදුරු 12ට දැමීමට අවශ්‍ය බීම බෝතල් ගනන කීය ද?

(iii) ඉතිරි වන බීම ප්‍රමාණය කොපමණ ද?

(04) (i) අරය 4cm ක් වූ වෘත්තයකින් අඳින්න.

(ii) කවකටුවේ පරතරය වෙනස් නොකර එම වෘත්තය නැවත කොටස් හයකට වෙන් කරන්න.

(iii) එම බෙදුම් ලක්ෂ්‍යයෙන් පිළිවෙළින් P, Q, R, S, T, U ලෙස නම් කරන්න.

(iv) Q , S , U ලක්ෂ්‍යය යා කර QSU ත්‍රිකෝණය ලබා ගන්න.

(v) පාදවල දිග අනුව මෙය කවර වර්ගයේ ත්‍රිකෝණයක් ද?

(vi) P, Q, R, S, T, U ලක්ෂ්‍ය පිළිවෙළින් යා කරන්න. එවිට ලැබෙන රූපයට වඩාත් ම සුදුසු නමක් යෝජනා කරන්න.

(vii) ඔබ ඇඳි රූපයේ ඇති සමාන ජ්‍යාය 2ක් නම් කරන්න.

(viii) සම ද්විපාද ත්‍රිකෝණයක් නම් කරන්න.

(05) (a) සුළු කරන්න.

(i) $2x + 5y + 3x - 2y$

(ii) ඉහත (i) ට ලැබුණු වීජීය ප්‍රකාශනයට $x = 3$ , $y = -2$ ආදේශ කරන්න.

(b) පොතක මිල පෑනක මිල මෙන් තුන් ගුණයකි. ළමයෙක් පොතක් හා පෑනක් මිලට ගෙන රු.100ක් දුන්නේ ය. පෑනක මිල රු. $x$ ලෙස ගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පොතේ මිල $x$ ඇසුරෙන් ලියන්න.

(ii) පොතේ සහ පෑනේ මිලෙහි එකතුව $x$ ඇසුරෙන් ලියන්න.

(iii) ඒ ඇසුරෙන් සමීකරණයක් ගොඩ නඟන්න.

(iv) එය විසඳා $x$ හි අගය සොයන්න.

(v) ඒ අනුව පොතක මිල කීය ද?

(06) සුදුසු කාටීසිය ඛණ්ඩාංක තලයක පහත දැක්වෙන ලක්ෂ්‍යයන් ලකුණු කොට පිළිවෙළින් යා කර සංවෘත රූපයක් ලබා ගන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(i) A(2,1) B(2,5) C(8,5) D(8,1)

(ii) ඔබට ලැබුණු සංවෘත රූපයට නමක් යෝජනා කරන්න.

(iii) එම රූපයේ සමමිතික අක්ෂ අඳින්න.

(iv) එම අක්ෂ ඡේදනය වන ලක්ෂ්‍යය ‘O’ ලෙස නම් කරන්න.

(v) ‘O’ හි ඛණ්ඩාංක ලියන්න.

(07) (a) (i) එකතු කරන්න.

| | g | mg |
|---|---|---|
| | 125 | 228 |
| + | 342 | 845 |

(ii) අඩු කරන්න.

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 10 | 7 | 11 |
| + | 5 | 8 | 18 |

(b) සුළු කරන්න.

(i) $3\frac{2}{3} + 2\frac{1}{6}$  (ii) 12.05 x 5  (iii) $57.5 \div 10$

(c) නැටුම් කණ්ඩායමක සාමාජිකාවකට ඇඳුමක් නිර්මාණය සඳහා රෙදි 2m 25cmක් අවශ්‍ය වේ. සාමාජිකාවන් 11 දෙනෙක් සඳහා අවශ්‍ය රෙදි ප්‍රමාණය කොපමණ ද?